පාර්ශ්වකරුවන් සඳහා උපදෙස් – වාචික උපදේශන

2026 සිව්වන කාර්තුව සඳහා විදුලි ගාස්තු සංශෝධනය පිළිබඳ මහජන උපදේශනය ලේඛනයේ සාරාංශය

2026 නොවැම්බර් 05 වන දින, කොළඹ 07, BMICH හිදී,

පසුබිම

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) විසින්, 2024 අංක 36 දරන (සංශෝධිත) ශ්‍රී ලංකා විදුලි පනතේ 29(10) වගන්තියට අනුකූලව, 2026 සිව්වන කාර්තුව (2026 ඔක්තෝබර් – දෙසැම්බර්) සඳහා විදුලි ගාස්තු සමාලෝචන ක්‍රියාවලිය ආරම්භ කර ඇත. මෙම සමාලෝචනය සඳහා, ජාතික පද්ධති ක්‍රියාකරු (National System Operator - NSO) විසින් ඉදිරිපත් කරන ලද තොග සැපයුම් පිරිවැය (Bulk Supply Cost) පුරෝකථනය මෙන්ම, විදුලිය බෙදාහැරීමේ සමාගම (Electricity Distribution Lanka (Pvt) Ltd.- EDL) වෙත පවරා ඇති පැරණි ණය (legacy loans) සම්බන්ධයෙන් එම සමාගම විසින් ඉදිරිපත් කරන ලද අතිරේක පිරිවැය ද සැලකිල්ලට ගෙන ඇත. බලපත්‍රලාභීන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු මත පදනම් වූ, පුරෝකථනය කරන ලද පිරිවැය සහ ආදායම් සාරාංශය පහත දැක්වේ.

අයිතමය	ඒකකය	2026 ඔක්තෝබර් - දෙසැම්බර් සඳහා පිරිවැය
විදුලි සැපයුම සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය	රු. බිලියන	157.3
විදුලි අලෙවියෙන් ලැබෙනු ඇතැයි අපේක්ෂිත මුළු ආදායම	රු. බිලියන	154.0
පසුගිය කාලපරිච්ඡේදයේ සිට ඉදිරියට ගෙන එන ලද ආදායම් හිඟය	රු. බිලියන	1.1
ඇස්තමේන්තුගත ආදායම් හිඟය	**රු. බිලියන**	**4.4**
විදුලි අලෙවි ආදායමෙහි සිදු කළ යුතු වැඩිවීම	%	2.88

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 17(ආ) වගන්තිය සහ 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ (සංශෝධිත) 29(10) වගන්තිය ප්‍රකාරව, ඉහත සඳහන් කරනු ලැබූ කාර්තුමය ගාස්තු සමාලෝචනය සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීමට කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

<u>පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පමණක් තම අදහස් සහ යෝජනා සීමා කරන මෙන් පාර්ශවකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.</u>

1. ජාතික පද්ධති ක්‍රියාකරු (NSO) විසින් ඉදිරිපත් කරන ලද විදුලි උත්පාදන සහ පිරිවැය පිළිබඳ පුරෝකථනය

වසරේ සිව්වන කාර්තුව සඳහා විදුලි උත්පාදන ඉල්ලුම ගිගාවොට් පැය (GWh) 4,796ක් ලෙස පුරෝකථනය කර ඇත. NSO විසින් ඉදිරිපත් කරන ලද, විදුලි බල ප්‍රභවය අනුව වර්ගීකරණය කළ විදුලි උත්පාදන පුරෝකථනය සහ පිරිවැය පුරෝකථනය පිළිබඳ සාරාංශය පහත දැක්වේ.

විදුලි උත්පාදන මූලාශ්‍රය	Unit	2026 සිව්වන කාර්තුව සඳහා විදුලි උත්පාදන මිශ්‍රණය පිළිබඳ පුරෝකථනය		2026 සිව්වන කාර්තුව සඳහා විදුලි උත්පාදන පිරිවැය පුරෝකථනය	
		In GWh	%	Rs. million	%
ප්‍රධාන ජල විදුලි	GWh	1,551	32.34%	4,041	3.45%
තාප විදුලි – ගල් අඟුරු	GWh	1,232	25.68%	36,278	30.93%
තාප විදුලි – ඩීසල්	GWh	28	0.58%	7,343	6.26%
තාප විදුලි - දැව් තෙල්	GWh	429	8.94%	28,527	24.32%
තාප විදුලි – නැෆ්තා	GWh	175	3.65%	8,823	7.52%
වෙනත් පුනර්ජනනීය බලශක්ති	GWh	1,382	28.81%	32,282	27.52%
එකතුව	GWh	4,796	100.00%	117,294	100.00%

විදුලි උත්පාදන සහ පිරිවැය පුරෝකථනය තුළ, වැඩිදුර විමර්ශනය සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර හඳුනාගෙන ඇත:

- වර්ෂාපතන පුරෝකථන හා සැසඳීමේදී, ජල විදුලි උත්පාදන පුරෝකථනයේ ප්‍රමාණවත්භාවය.

- අදාළ කාර්තුව තුළ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය කෙරෙහි, බැටරි බලශක්ති ගබඩා පද්ධති (BESS) හඳුන්වා දීමේ බලපෑම.

NSO (ජාතික පද්ධති ක්‍රියාකරු) විසින් පැහැදිලි කර ඇති පරිදි, ඉදිරිපත් කර ඇති ගල් අඟුරු බලශක්ති පිරිවැයට, ගල් අඟුරු වල ගුණාත්මකභාවය සම්බන්ධ ගැටලුවක් හේතුවෙන් ඇති වූ කිසිදු අමතර පිරිවැයක් ඇතුළත් නොවේ.

2. විදුලි උත්පාදනය – බලශක්ති පිරිවැය

2026 වසරේ සිව්වන කාර්තුව සඳහා රුපියල් බිලියන 98.3ක විදුලි උත්පාදන බලශක්ති පිරිවැයක් NSO (ජාතික පද්ධති ක්‍රියාකරු) විසින් ඉදිරිපත් කර ඇත. ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලට සාපේක්ෂව දෙසැම්බර් මාසය සඳහා වන ජල විදුලි සහ වෙනත් පුනර්ජනනීය බලශක්ති ප්‍රක්ෂේපණ අඩු මට්ටමක පැවතීම හේතුවෙන්, දෙසැම්බර් මාසයේ පිරිවැය අනෙක් මාස දෙකට වඩා ආසන්න වශයෙන් 34%කින් ඉහළ ගොස් ඇත.

3. ඉන්ධන මිල

පෙර කාර්තුව සඳහා යොදාගත් මිල ගණන් හා සසඳන විට, ගල් අඟුරු මිලෙහි සැලකිය යුතු ඉහළ යාමක් දක්නට ලැබේ. මීට අමතරව, 'ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (පෞද්ගලික) සමාගම' (EGL) තවමත් ඉන්ධන සැපයුම් ගිවිසුමකට (FSA) එළඹ නොමැති අතර, 'වෙස්ට්කෝස්ට්' (Westcoast) සහ 'සොබධනවි' (Sobadhanavi) බලාගාරවල ඉන්ධන සැපයුම් ගිවිසුම්වලට විනිවිදභාවයෙන් යුත් මිල නියම කිරීමේ විධිවිධාන ඇතුළත් කර නොමැත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ද්‍රව ඉන්ධන භාවිතයෙන් විදුලිය උත්පාදනය කිරීමේ පිරිවැය පිළිබඳ පුරෝකථන, සම්පූර්ණයෙන්ම ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ (CPC) ඉන්ධන මිල පිළිබඳ උපකල්පන මත රඳා පවතින තත්ත්වයක් පවතී.

4. විදුලි උත්පාදනය – ධාරිතා පිරිවැය

සිව්වන කාර්තුව සඳහා රු. බිලියන 19ක විදුලි උත්පාදන ධාරිතා පිරිවැයක් NSO (ජාතික පද්ධති ක්‍රියාකරු) විසින් ඉදිරිපත් කර ඇත. 2026 වසරේ තුන්වන කාර්තුව සඳහා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ධාරිතා පිරිවැය හා සැසඳීමේදී, මෙම නවතම පුරෝකථනය තුළ රු. බිලියන 1.1ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ EGL බලාගාර සඳහා වන වියදම් වන අතර, ඉහත සඳහන් මුදලින් රු. බිලියන 0.7ක්ම ඊට අදාළ වේ. විශේෂයෙන්ම, මෙම EGL බලාගාර ක්‍රියාත්මක වන්නේ විදුලි බල මිලදී ගැනීමේ ගිවිසුම් (PPAs) නොමැතිවය.

5. BESS ධාරිතා පිරිවැය

2026 සැප්තැම්බර් මාසයේ සිට අදියර වශයෙන් මෙගාවොට් 160ක (160 MW) බැටරි ගබඩා ධාරිතාවක් පද්ධතියට සම්බන්ධ කිරීමට NSO ආයතනය අපේක්ෂා කරන අතර, සිව්වන කාර්තුව සඳහා ධාරිතා පිරිවැය ලෙස රුපියල් මිලියන 703ක් ඊට ඇතුළත් කර ඇත. ඉදිරිපත් කර ඇති යෝජනාවේ, අපේක්ෂිත මාසික ආරෝපණ (charging) සහ විසර්ජන (discharging) ප්‍රමාණයන් පිළිබඳව නිශ්චිතව සඳහන් කර නොමැත.

6. පසුගිය කාලපරිච්ඡේදවලට අදාළ ආදායම් අතිරික්තයන්/ හිඟය ගැලපීම

අය ක්‍රම ක්‍රමවේදයට (Tariff Methodology) අනුව, යම් කාලපරිච්ඡේදයක් තුළ තොග සැපයුම් සහ මෙහෙයුම් ව්‍යාපාරය (Bulk Supply and Operations Business) මගින් උද්ගත වන ආදායම් අතිරික්තයන් හෝ හිඟයන්, ඉන් කාර්තු දෙකකට පසුව ගැලපීමට ලක් කෙරේ. ඒ අනුව, 2026 වසරේ දෙවන කාර්තුවට අදාළ ආදායම් තත්ත්වය, සිව්වන කාර්තුමය ගාස්තු සමාලෝචනය සඳහා අදාළ වේ. 2026 වසරේ දෙවන කාර්තුව තුළ ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු භාවිතය හේතුවෙන් ඇති වූ බවට ඇස්තමේන්තුගත අමතර පිරිවැය වන රුපියල් බිලියන 2.9ක මුදල ඉවත්

කිරීමෙන් අනතුරුව, එම කාර්තුව සඳහා රුපියල් බිලියන 1.1ක ආදායම් ඌනතාවක් පවතින බව ජාතික පද්ධති ක්‍රියාකරු (NSO) විසින් දැනට පවතින දත්ත මත වාර්තා කර ඇත.

7. EDL ඉදිරිපත් කර ඇති අතිරේක පිරිවැය

අය ක්‍රම ක්‍රමවේදයට අනුව, බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ ආදායම් සීමාවන් බහු-වසර අයක්‍රම ඉදිරිපත් කිරීම මත පදනම්ව සකසා ඇත. කෙසේ වෙතත්, EDL බහු-වසර අයක්‍රම රාමුවෙන් පිටත සිවිවන කාර්තුව සඳහා අතිරේක වියදම් ලෙස රුපියල් බිලියන 2.1 ක් ඉදිරිපත් කර ඇත. මෙම මුදලින් රුපියල් බිලියන 1.1 ක් සහායක විදුලි සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (SESRIP) හා සම්බන්ධ ණයක් ආපසු ගෙවීමට අදාළ වේ. මෙම පිරිවැය ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගත නොහැකි යැයි සැලකේ, මන්ද එය ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන කටයුතුවලට අදාළ වේ. එවැනි වියදම් අයක්‍රම හරහා ගෙවිය යුත්තේ අදාළ වත්කම් සම්පූර්ණ කර ප්‍රාග්ධනීකරණය කිරීමෙන් පසුව පමණි. ඒ අනුව, මූලික ඇගයීම් වලදී මෙම පිරිවැය ඉවත් කර ඇත.

8. ගාස්තු සංශෝධන ප්‍රතිශතය

EDL ආයතනයට අදාළ SESRIP පිරිවැය හැර, බලපත්‍රලාභීන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු මත පදනම්ව, අවශ්‍ය ගාස්තු සංශෝධන ප්‍රතිශතය 2.88%ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කොමිෂන් සභාව විසින් සිදු කරන ලද මූලික සමාලෝචනය මත පදනම්ව, EGL විදුලි උත්පාදන ධාරිතා පිරිවැයේ වැඩිවීම ඉවත් කර ඇති අතර, 2026 වසරේ දෙවන කාර්තුවේදී ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු භාවිතය හේතුවෙන් දැරීමට සිදුවන අතිරේක පිරිවැය පිළිබඳ ඇස්තමේන්තුව ද සංශෝධනය කර ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අවශ්‍ය ගාස්තු සංශෝධන ප්‍රතිශතය 1.46% දක්වා අඩු වී ඇත.

<u>මහජන උපදේශනයන්ට අදාළ නීති</u>

- ඉදිරිපත්කිරීම් සිංහල, ඉංග්‍රීසි හෝ දෙමල යන මාධ්‍ය වලින් ඉදිරිපත් කළ හැකිය
- සියලු ඉදිරිපත් කිරීම් ඉහත සඳහන් කර ඇති මාතෘකා වලට අදාළ විය යුතුය.
- සෑම කථිකයෙකුටම ඔහුගේ/ඇයගේ ඉදිරිපත් කිරීම සඳහා මිනිත්තු 10ක පමණ කාලයක් ලබා දෙනු ලැබේ. එම කාල පරාසය අවසන් වීමට මිනිත්තු 2කට පෙර සීනුව එක්වරක් නාද වන අතර, කාලය අවසන් වීමේදී දෙවරක් සීනුව නාද කරනු ලැබේ. එහිදී ඔබගේ ඉදිරිපත්කිරීම අවසන් කළ යුතුය
- ඉදිරිපත්කිරීම් තුළදී යම් පුද්ගලයෙකු,ආයතනය හෝ රජය පදනම් විරහිත විවේචන හෝ ප්‍රශංසා සිදු නොකළ යුතුය.
- මහජන උපදේශනය අතරතුර කිසිදු ව්‍යාපාර ප්‍රචාරණ ක්‍රියාකාරකම් හෝ එවැනි ක්‍රියාකාරකම් සඳහා සහාය දැක්වීම නොකළ යුතුය.
- උපදේශනය අතරතුර ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න ඇසීමෙන් වැළකී සිටිය යුතුය
- උපදේශනය අතරතුර අත්පොළසන් දීමෙන් හෝ වෙනයම් ආකාරයක බාධාවක් කිරීමෙන් වැළකී සිටිය යුතුය.
- කරුණාකර අදහස් දැක්වීම් අතරතුර ඔබගේ ජංගම දුරකථන ක්‍රියා විරහිත හෝ නිහඬ කර හෝ තබාගන්න.